**මැදගම ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

-------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 27 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 16 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**

---------

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මැදගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

සමාලෝචිත වර්ෂය තුලදී සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රය කුලියට දීමෙන් අයවිය යුතු රු. 140,620 ක ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 58,331,134 ක වත්කම් විෂයයන් 02 ක්, රු. 15,507,020 ක වගකීම් විෂයයක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,521,335 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,981,372 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 3,539,963 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 හිඟ ආදායම්

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 හා 159 වගන්ති වල විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.3,068,008 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

#### 2.2.2 වරිපනම් බදු

--------------

වරිපනම් ඒකක 19 කින් අඛණ්ඩව වරිපනම් බදු අය වී නොතිබු අතර ඊට අදාල හිඟ වරිපනම් බදු ශේෂය රු. 89,316 කි. වරිපනම් ඒකක 27 ක නිශ්චිත බදුකරු නම්කර හිඟ වරිපනම් අයකර ගැනිමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

#### 2.2.3 බදු කුලී

---------

සභාව සතු දේපල 07 ක් 2014 වර්ෂයේ දී ටෙන්ඩර් නොකර 2013 වර්ෂයේ බදු ගත් පුද්ගලයන්ට එම වර්ෂයේ ටෙන්ඩර් මුදලට සියයට 5ක් එකතු කර බදු දී තිබුණි.

**2.2.4 වෙනත් ආදායම්**

**------------------**

සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් කාල පරිච්ඡේදයට අදාලව බැකෝලෝඩර් යන්ත්‍රය පුද්ගලයන් 08 දෙනෙකු වෙත කුලී පදනම මත සේවා සැපයීම වෙනුවෙන් අයවිය යුතු රු. 140,620 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,925,640 |
| මුද්දර ගාස්තු | 274,918 |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**---------------------------**

සමාලෝචිත වර්ෂය තුලදී සංවර්ධන වැඩ සටහන් 04 ක් යටතේ ප්‍රතිපාදන අනුමත කරනු ලැබූ රු. 1,687,327 ක කර්මාන්ත 07 ක් විවිධ හේතු නිසා ආරම්භ කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1)(i) වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව විවිධ තනතුරු සඳහා පුද්ගලයන් තිදෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය අවසානයට රු.315,070 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 04. <u>පද්ධති හා පාලනය</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය